# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2488/03 – 2026 මැයි මස 11 වැනි සඳුදා – 2026.05.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

**53 වන වගන්තිය යටතේ වූ නියමය**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ (මින් මතු 'පනත' ලෙස හැඳින්වෙන) 53වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2026.05.04 දිනැති අංක 26/0862/804/111 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අයදුම්කරුගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවට;

(ආ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනාගත් ව්‍යාපාරයේ අයදුම්කරුගේ නම මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බවට;

(ඇ) එම ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බවට; සහ


1A – PG 7701 – 378 (2026/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) අදාළ පැනවීම් යටතේ ප්‍රදානය කරන ලද නිශ්චිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු අතර, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මක වීම අවසන් විය යුතු බවට,

නිශ්චිතව දක්වමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 11 වැනි දින
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරන ලද ව්‍යාපාරයේ විස්තර**

| | | | |
|---|---|---|---|
| 1. | අයදුම්කරුගේ නම | හෝම් ලැන්ඩ්ස් පෝර්ට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ්<br>(HOME LANDS PORT CITY (PVT) LTD) | |
| 2. | බලයලත් තැනැත්තාගේ බලපත්‍ර අංකය | CPCEC/2026/0203 | |
| 3. | බලපත්‍රය නිකුත් කළ දිනය | 2026 අප්‍රියෙල් 15 | |
| 4. | සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2025 අංක 01 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 3 වන නියෝගය - “A” කාණ්ඩයෙහි නිශ්චිතව දක්වා ඇති නිර්ණායක | |
| 5. | බිම් බදු ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව | මෙම ගැසට් පත්‍රය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් ඇතුළත, ඉහත සඳහන් බලයලත් තැනැත්තා විසින් අංක 1-01-01 දරන බිම් කැබැල්ල සඳහා වන බිම් බදු ගිවිසුමට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සමඟ එළඹීමට අපොහොසත් වුවහොත්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර තත්ත්වය අවලංගු වනු ඇත. | |
| 6. | බිම් කැබලි කේතය | 1-01-01 | |
| 7. | බිම් කැබැල්ලේ වපසරිය (වර්ග මීටර්) | 12,527.80 | |
| 8. | බිම් පරිහරණය | මිශ්‍ර භාවිතය 1 | |
| 9. | යෝජිත ආයෝජනය – ඉඩමේ බදු මුදල | ශ්‍රී.ල.රු. 12,558,339,769 කි. | |
| 10. | යෝජිත ආයෝජනය – සංවර්ධනය කිරීම | ඇ.ඩො. 110,000,000 | |
| 11. | රැකියා අවස්ථා | 447 | |
| 12. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව (වර්ෂ) | වසර 5 කි. | |
| 13. | යෝජිත ආයෝජනය | වර්ෂය 1 | ශ්‍රී.ල.රු. 3,139,584,942<br>ඇ.ඩො. 10,645,161 |
| | | වර්ෂය 2 | ශ්‍රී.ල.රු. 1,883,750,965<br>ඇ.ඩො. 13,548,387 |
| | | වර්ෂය 3 | ශ්‍රී.ල.රු. 2,511,667,954<br>ඇ.ඩො. 20,000,000 |
| | | වර්ෂය 4 | ශ්‍රී.ල.රු. 2,511,667,954<br>ඇ.ඩො. 32,903,226 |
| | | වර්ෂය 5 | ශ්‍රී.ල.රු. 2,511,667,954<br>ඇ.ඩො. 32,903,226 |
| | | එකතුව | ශ්‍රී.ල.රු. 12,558,339,769<br>ඇ.ඩො. 110,000,000 |

## II වන උපලේඛනය

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

යෝජිත නිවුන් කුලුනු සංවර්ධනය යනු කොළඹ වරාය නගරය තුළ සැලසුම් කර ඇති පරිවර්තනීය පරිසර හිතකාමී සුඛෝපභෝගී නේවාසික ව්‍යාපෘතියක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ සිරස් වනාන්තර මහල් ප්‍රජාව (vertical forest high-rise residential community) ලෙස අපේක්ෂා කෙරේ. හෝම් ලෑන්ඩ්ස් පෝර්ට් සිටි (පුද්ගලික) සමාගම විසින් සංවර්ධනය කරනු ලබන මෙම ව්‍යාපෘතිය මගින්, ගෝලීය වශයෙන් තරඟකාරී විශේෂ ආර්ථික කලාපයක් (SEZ) තුළ බුද්ධිමත් බව, නවෝත්පාදනය සහ ආයෝජන මට්ටමේ නිශ්චල දේපළ ඒකාබද්ධ කෙරෙන මීළඟ පරම්පරාවේ නාගරික ජීවන ආකෘති පාරිසරික ගෘහ නිර්මාණ ශිල්පයක් හඳුන්වා දෙයි. මෙම සැලසුම "සිරස් නාගරික වනාන්තර" (Vertical Urban Forest) සංකල්පය මත පදනම් වී ඇති අතර, මෙම පාරිසරික දැක්ම සමඟ සමපාත වන අතිශය සුඛෝපභෝගී පහසුකම් මෙයට ඇතුළත් වේ.

## III වන උපලේඛනය

| | *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | *ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* | *ආරම්භ වන දිනය* | *අවසන් වන දිනය* |
|---|---|---|---|---|
| 1 | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | සංස්ථාපිත ආදායම් බදු වලින් සියලුම ලැබීම් සහ ලාභ නිදහස් කිරීම සහ එම බදු නිදහස් කිරීම්; | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව අවසානයේදී | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව අවසානයේ සිට වසර දහයක් (10) දක්වා. |
| 2 | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3 | 2002 අංක 11 දරන මුදල් පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 4 | 2005 අංක 5 දරන මුදල් පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 5 | 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 6 | (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ හා සේවා ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ |

| III වන උපලේඛනය (සම්බන්ධිතයි) | | | | |
|---|---|---|---|---|
| | *පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්* | *ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* | *ආරම්භ වන දිනය* | *අවසන් වන දිනය* |
| 7 | 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ |
| 8 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, ව්‍යාපාරයට අදාළ භාණ්ඩ ආනයනය කිරීම් සියල්ලම මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබේ. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ |
| 9 | 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10 | 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මෙම පනතේ 2 වන වගන්තිය, 11 වන වගන්තිය සහ 12 වන වගන්තියෙන් නිදහස් කිරීම. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවලංගු කරනු ලැබූ පසු |
| 11 | (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | මෙම පනතේ 2 වන වගන්තියෙන් නිදහස් කිරීම | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවලංගු කරනු ලැබූ පසු |
| 12 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි 3 දිනැති අංක 2282/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මෙම පනතේ අනෙකුත් සියලුම විධිවිධානවලින් නිදහස් කිරීම. | මෙම නියෝගය ප්‍රකාශයට පත් කළ දිනය | බලයලත් තැනැත්තාගේ බලපත්‍රයේ වලංගු කාලය අවසන් වූ පසු හෝ එය අවලංගු කරනු ලැබූ පසු |
| 13 | 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 05 - 0174

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.